# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.25 පැය 2355 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1944/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**අණ නොතකා ධාවනය කල වෑන් රථයකට පොලිස් වෙඩි තැබීමක් - ගල්කිස්ස පොලිස් වසම.**

2025.10.25 වන අද දින සවස් කාලයේ පිළියන්දල පොලිස් වසමේ සුවාරපොල ප්‍රදේශයේ රථවාහන රාජකාරි යෙදෙමින් සිටි බස්නාහිර පළාත් දකුණ කොට්ඨාස රථවාහන නිලධාරීන් හට ලද තොරතුරක් මත මාර්ගයේ ගමන්කල සැකකටයුතු වෑන් රථයක් නැවැත්වීමට සංඥා කර ඇති අතර එම අවස්ථාවේ එම වෑන් රථය ගල්කිස්ස ප්‍රදේශයට නොනවත්වා ධාවනය කර ඇත.

නිලධාරීන් විසින් මෙම වෑන් රථයේ පසුපස හඹාගෙන ගොස් නැවැත්වීමට සංඥා කල ද නොනවත්වා මාර්ගයේ ගමන් කරමින් තිබූ වාහන කිහිපයක් ද අනතුරට ලක්කරමින් ධාවනය කිරීම හේතුවෙන් නිලධාරීන් විසින් වෑන් රථයේ රෝදවලට වෙඩි තබා ඇත. ඉන් අනතුරුව වෑන් රථය ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපල අසල නැවතී ඇති අතර එහි රියදුරු වෑන් රථයෙන් බැස පලා යාමේදී ඇද වැටී තුවාල ලැබීම හේතුවෙන් පොලිස් නිලධාරීන් විසින් සැකකාර රියදුරු අත්අඩංගුවට ගෙන ප්‍රතිකාර සඳහා කළුබෝවිල රෝහලට ඇතුලත්කර ඇත.

සැකකරු වයස අවුරුදු 30 ක් වන ගල්කිරියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකරු මත්පැන් පානය කර සිට ඇති බවට සිදු කරනලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. ගල්කිස්ස පොලිසිය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය